// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2119/6 - 2019 අප්‍රේල් මස 17 වැනි බදාදා - 2019.04.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය 2013(2014)

අංක 1940 හා 2015.11.06 දිනැති *ගැසට් නිවේදනය* මගින් තාවකාලිකව අත්හිටුවා ඇති, අංක 1933 හා 2015.09.18 දිනැති *ගැසට් නිවේදනයෙන්* සංශෝධිත ''ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත/සීමිත තරඟ විභාගය 2013(2014) '' මැයෙන් යුතු අංක 1929 හා 2015.08.21 දිනැති *ගැසට් නිවේදනයේ* අනු අංක 2.3 යටතේ සඳහන් පුරප්පාඩු පහත සංශෝධන වලට යටත්ව පිරවීම සඳහා විවෘත තරඟ විභාගය පැවැත්වීමට කටයුතු කරන බව මෙයින් දන්වමි.

01. ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර ඇති අංක SC(FR) 283/2014 නඩුව සඳහා තීරණයක් ලැබෙන තුරු එම නඩුවට බලපෑමක් නොවන පරිදි කෘෂි සංවර්ධන ධාරාව යටතේ විවෘත පදනම මත වන පුරප්පාඩු වලින් 51 ක් පමණක් සම්පූර්ණ කිරීමටත්,

02. කෘෂි සංවර්ධන ධාරාව යටතේ විවෘත පදනම මත වන ඉතිරි පුරප්පාඩු 18 ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර ඇති අංක SC(FR) 283/2014 නඩුව සඳහා තීරණයක් ලැබුණු පසු සම්පූර්ණ කිරීමටත්,

මෙම බඳවා ගැනීම සම්බන්ධ අනෙකුත් විධිවිධාන හා කොන්දේසි අංක 1933 හා 2015.09.18 දිනැති *ගැසට් නිවේදනයෙන්* සංශෝධිත, අංක 1929 හා 2015.08.21 දිනැති *ගැසට් නිවේදනයට* අනුකූලව බල පැවැත්වෙන බව ද දන්වමි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

කේ. ඩී. එස්. රුවන්චන්ද්‍ර,
ලේකම්,
කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු,
පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ
ජල සම්පත් සංවර්ධන අමාත්‍යාංශය.

2019 අප්‍රේල් මස 12 වැනි දින,
අංක 288, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය.

05 - 5/1

1A - G 29894 — 20 (2019/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය 2013(2014)

අංක 1940 හා 2015.11.06 දිනැති *ගැසට් නිවේදනය* මගින් තාවකාලිකව අත්හිටුවා ඇති, අංක 1933 හා 2015.09.18 දිනැති *ගැසට් නිවේදනයෙන්* සංශෝධිත ''ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත/සීමිත තරඟ විභාගය 2013(2014)'' මැයෙන් යුතු අංක 1929 හා 2015.08.21 දිනැති *ගැසට් නිවේදනයේ* අනු අංක 2.3 යටතේ සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සීමිත තරඟ විභාගය පැවැත්වීමට කටයුතු කරන බව මෙයින් දන්වමි.

මෙම බඳවා ගැනීම සම්බන්ධ අනෙකුත් විධිවිධාන හා කොන්දේසි අංක 1933 හා 2015.09.18 දිනැති *ගැසට් නිවේදනයෙන්* සංශෝධිත, අංක 1929 හා 2015.08.21 දිනැති *ගැසට් නිවේදනයට* අනුකූලව බල පැවැත්වෙන බව ද දන්වමි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

කේ. ඩී. එස්. රුවන්චන්ද්‍ර,
ලේකම්,
කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු,
පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ
ජල සම්පත් සංවර්ධන අමාත්‍යාංශය.

2019 අප්‍රේල් මස 12 වැනි දින,
අංක 288, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය.

05 - 5/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.